දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033, 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) MH/AD/01/09/DDG(ET&R)/2025
எனது இல )
My No. )

(03)

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය ) 2025. 07. 13
திகதி )
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

පොදු චක්‍රලේඛ ලිපි අංක : 02 – 54/2025

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් - ජාතික රෝහල (කොළඹ, මහනුවර, ගාල්ල)
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්, විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන්,
රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති සියලුම රෝහල් හා ආයතන ප්‍රධානීන්.

## <u>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ) තනතුර</u>
## <u>සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය</u>

මෙම අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ) තනතුරට අයදුම්පත් කැඳවීම සඳහා 2021.11.02 දිනැතිව නිකුත් කරන ලද අංක 01-21/2021 දරන පොදු චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර 2014.10.11 දිනැති අංක 1883/17 දරන ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ සහ ඉන් පසු එයට වරින් වර කරන ලද සංශෝධනයන්හි පරිශිෂ්ඨය V හි සඳහන් ඉහත තනතුරට අදාළ සුදුසුකම් ලද **ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධරයන්ගෙන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධරයන්ගෙන්** නැවත අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අදාළ අයදුම්පත් මේ සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුව සකස් කොට, ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට **2025.07. 28** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** එවිය යුතුය.

03. තම අයදුම්පත්‍රය ඉල්ලා අස් කර ගැනීමට කිසිවෙකු අදහස් කරන්නේ නම් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දින සිට සති දෙකක් ඇතුළත මා වෙත දන්වා එසේ කිරීමට ඔහුට/ඇයට හැකිය.

04. රැකියා විස්තරය

I. සෞඛ්‍ය සඳහා වන මානව සම්පත් ප්‍රතිපත්ති සංවර්ධනය සහ සංශෝධනය කිරීම (හෙද, පරිපූරක, අතුරු වෛද්‍ය, තාක්ෂණික සහ තාක්ෂණික නොවන කාර්ය මණ්ඩල)
II. සෞඛ්‍ය අංශයේ සියලුම කාර්ය මණ්ඩල සඳහා සේවාස්ථ පුහුණුව ලබා දීම
III. ප්‍රතිපත්ති සම්පාදනය සහ ජාතික සෞඛ්‍ය පර්යේෂණ මාර්ගෝපදේශ ප්‍රතිශෝධනය කිරීම

IV. අධ්‍යක්ෂ (පුහුණු), අධ්‍යක්ෂ (පර්යේෂණ), අධ්‍යක්ෂ (ජාතික සෞඛ්‍ය විද්‍යායතනය), අධ්‍යක්ෂ (වෛද්‍ය පර්යේෂණායතනය) සහ අධ්‍යක්ෂ (හෙද අධ්‍යාපන) අධීක්ෂණය කිරීම සහ ඔවුන් සමඟ කටයුතු කිරීම

V. ඉගැන්වීමේ විෂයමාලා, ද්‍රව්‍ය සහ ඉගැන්වීමේ ක්‍රමවේද සංවර්ධනය සහ ප්‍රතිශෝධනය කිරීම

VI. ජාතික සහ ජාත්‍යන්තර අධ්‍යයන හා වෘත්තීය සංවිධානවල සම්බන්ධීකරණය සහ නියෝජනය කිරීම

VII. සෞඛ්‍ය අංශය හැර අනෙකුත් ආයතනවලට තාක්ෂණික සහාය ලබා දීම

VIII. සියලුම ප්‍රාථමික සහ පශ්චාත් ප්‍රාථමික පුහුණු වැඩසටහන් සඳහා අධ්‍යාපන සහ පුහුණු සැලසුම් සකස් කිරීම

ප්‍රාථමික පුහුණු පාඨමාලා - හෙද, වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදය, ඖෂධවේදය, විකිරණශිල්පය, භෞත චිකිත්සාව, වෘත්තිය චිකිත්සාව, රෝහල් සහ පවුල් සෞඛ්‍ය නිලධාරිනි, මහජන සෞඛ්‍ය පරීක්ෂක, කීට විද්‍යා සහකාර, මහජන සෞඛ්‍ය රසායනාගාර කාර්මික ශිල්පී, විද්‍යුත් නිකර්පන රේඛණ සටහන්කරු, බණ්තු රේඛණ ශිල්පී, අක්ෂි තාක්ෂණවේදය, විකලාංග වැඩපල කාර්මික ශිල්පී, මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර සහායක, ඖෂධ සංයෝජක, දන්ත කාර්මික ශිල්පී, පාසල් දන්ත චිකිත්සක, ශ්‍රවණවේදී කාර්මික ශිල්පී, උපස්ථායක, විදේශීය සිසුන් දේශීය ආයතනවලද දේශීය සිසුන් විදේශීය ආයතනවලද පුහුණු කිරීම සහ ඇතුළත් කිරීම සහ අවශ්‍යතාවය මත පැනනඟින වෙනත් පාඨමාලා

පශ්චාත් ප්‍රාථමික හෙද පාඨමාලා - ළමා වෛද්‍ය විද්‍යා පුහුණුව, දැඩි සත්කාර ඒකක පුහුණුව, ශල්‍යාගාර පුහුණුව, මනෝ වෛද්‍ය විද්‍යා පුහුණුව, කළමනාකරණ සහ අධීක්ෂණ පුහුණුව, ඉගැන්වීම් සහ අධීක්ෂණ පුහුණුව, වින්නඹු කර්මය පිළිබඳ පුහුණුව, විකලාංග පුහුණුව, වෘක්ක සත්කාර ඒකක පුහුණුව, අන්ත්‍රා ද්වාරණ පුහුණුව, හදිසි සත්කාර පිළිබඳ හෙද පුහුණුව

IX. පුහුණු ආයතන අතර සිසුන් මාරු කිරීමේ කටයුතු

X. ඉහත සියලුම පාඨමාලා පැවැත්වීම සහ ඇගයීම

XI. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ) යටතේ වන සියලුම පළාත්/ ප්‍රාදේශීය/ මහජන සෞඛ්‍ය වින්නඹු කර්මය පිළිබඳ පුහුණු මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම, පුළුල් කිරීම, අධීක්ෂණය, තාක්ෂණික උපදෙස් ලබා දීම සහ එම පුහුණු ආයතනවලට සිසුන් ඇතුළත් කිරීම

XII. විෂයමාලා (විෂයමාලා සංවර්ධනය සහ සංශෝධනය), ඉගැන්වීම් ක්‍රම සහ ඉගැන්වීම් ද්‍රව්‍ය සඳහා වන සම්මතයන් සහ ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම

XIII. සේවා කළමනාකරණය පිළිබඳ වගකීම් දරණ නිලධාරීන් (අනෙකුත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් ආදී නිලධාරීන්) සහ සියලුම කාණ්ඩවල සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල අධ්‍යාපන සහ පුහුණු පහසුකම් පිළිබඳ වගකිව යුතු නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීම

XIV. සෞඛ්‍ය පද්ධති පර්යේෂණ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ප්‍රවර්ධනය, අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම

XV. නිල බලයෙන් ජාතික සෞඛ්‍ය පර්යේෂණ සභාවේ ලේකම් ලෙස කටයුතු කිරීම

XVI. සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ අංශය අධීක්ෂණය කිරීම සහ පරිපාලනය පිළිබඳ වගකීම දැරීම

XVII. අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ අංශයේ සේවය කරන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය සහතික කිරීම

XVIII. පශ්චාත් ප්‍රාථමික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සියලුම කාණ්ඩ සඳහා අධ්‍යාපන/ සේවාස්ථ පුහුණු වැඩසටහන් අඛණ්ඩව සිදු කිරීම

XIX. සියලුම වෛද්‍ය නිලධාරීන් සහ පළාත්/ ප්‍රාදේශීය සෞඛ්‍ය බලධාරීන් සඳහා ජාතික අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම

XX. වෛද්‍ය සහ පශ්චාත් උපාධි පුහුණු ප්‍රමිතීන් අතර ඵලදායී ලෙස කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සඳහා සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩල වෙනුවෙන් උසස් තත්ත්වයේ පුහුණු ස්ථාපිත කිරීම සඳහා වෛද්‍ය විද්‍යාලවල, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ, පශ්චාත් වෛද්‍ය විද්‍යා උපාධි ආයතනයේ, ජාතික විද්‍යා පදනමේ පැවැත්වෙන සියලුම අදාළ රැස්වීම්වලදී අමාත්‍යාංශය නියෝජනය කිරීම

XXI. අනෙකුත් රටවල්වල විශේෂයෙන් අග්නි දිග ආසියානු කලාපයේ සහ සාර්ක් කලාපීය රටවල්වල සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා වන අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම

XXII. සෞඛ්‍ය හා ජනමාධ්‍ය ලේකම්, අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම

## 05. සේවා නියමයන් හා කොන්දේසි

(අ) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අපේක්ෂකයා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 118 වගන්තිය අනුව අවුරුදු 01 ක වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ. වැඩ බැලීමේ කාලය තුළ කිසියම් අවස්ථාවකදී නැතහොත් වැඩබැලීමේ කාලය අවසානයේදී තෝරාගත් නිලධාරියා කිසියම් හේතුවක් නිසා එම තනතුර දැරීමට නුසුදුසු බව හෙලිදරව් වන්නේ නම්, එම නිලධරයා ඔහුගේ පූර්ව තනතුරට පෙරළා යවනු ලැබේ.

(ආ) මෙම තනතුරට පත් කරනු ලබන නිලධාරියාහට පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදීමට හිමිකමක් නොමැත.

(ඇ) අංක 2410/09 හා 2024.11.17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වන සංශෝධනයේ 11.1.2.3 හි VIII වගන්තිය ප්‍රකාරව මෙම තනතුර අවසන් සේවා ස්ථානීය තනතුරක් ලෙස සලකනු ලබන අතර ස්ථාන මාරුවීම්වලට යටත් නොවේ.

(ඈ) සියලු පත්කිරීම් ඉදිරි දිනක සිට ක්‍රියාත්මක වනු ඇති අතර, දැනටමත් මෙම තනතුරේ වැඩ බලන හෝ රාජකාරි ඉටු කරන හෝ රාජකාරි ආවරණය කරන නිලධාරියෙකු තෝරා ගත හොත් එම නිලධාරියාහට තම පත්කිරීම පෙරදාතම් කිරීම සඳහා ඉල්ලීමට කිසිදු හිමිකමක් නොමැත.

## 06. වැටුප් ක්‍රමය

(අ) මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව SL-03-2025 වැටුප් ඛණ්ඩයේ පියවර 1 (රු. 156,000 - 12 X 4850 – 214,200 ) අදාළ වේ.

(ආ) පශ්චාත් උපාධි සුදුසුකම් සහිත වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිලධාරීන්ට මසකට රු. 6,000/- ක් බැගින් වූ වෛද්‍ය පරිපාලන දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) මෙම තනතුරට විශේෂඥ වෛද්‍ය නිලධරයකු තෝරාගනු ලැබුවහොත් විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියට හිමි වැටුප් දීමනා ලබා ගැනීමට ඔහුට/ ඇයට හිමිකම් ඇත.

## 07. වයස් සීමාව

සුදුසුකම් ලබන අයදුම්කරුවන් දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් වන බැවින් වයස සීමාව අදාළ නොවේ.

## 08. සුදුසුකම්

I. අංක 2410/09 හා 2024.11.17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වන සංශෝධනයෙහි 11.1.2.3 (අ) අනුව, වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ඨ II හි ලැයිස්තුගත කරන ලද විද්‍යාපති (වෛද්‍ය පරිපාලන/ප්‍රජා වෛද්‍ය) උපාධියක් ලබා ඇති ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු හෝ විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු වීම.

(2007.04.16 දිනැති අංක 1493/3 දරන ගැසට් නිවේදනය ක්‍රියාත්මකවන දින වනවිට ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකුට මෙම අනිවාර්ය සුදුසුකම අදාළ නොවේ.)

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛයන්හි විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

III. සියලු සුදුසුකම්, අයදුම්පත් භාර ගනු ලබන අවසාන දිනයට සලකා බලනු ඇත.

09. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය

| | නිර්ණායක | | ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| I. | **සේවා කාලය**<br><br>(ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ සක්‍රිය සේවා කාලය සඳහා වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 50)<br><br>"සක්‍රිය සේවා කාලය ගණනය කිරීමේ දී වසරකට අඩු කාලයක් සඳහා කාර්තු වශයෙන් සමානුපාතිකව ලකුණු ගණනය කෙරේ" | | මුළු ලකුණු 50 |
| II. | **පශ්චාත් උපාධි සුදුසුකම්**<br><br>ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වන සංශෝධනයෙහි 11.1.2.3 හි (අ) II හි විධිවිධාන හා අන්තර්කාලීන විධිවිධානවලට අනුව පහත පරිදි ලකුණු හිමි වේ.<br><br>වෛද්‍ය විශාරද උපාධිය - ලකුණු 15<br>(වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය)<br><br>විද්‍යාපති උපාධිය - ලකුණු 10<br>(වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය)<br><br>"සැ.යු. - මේ අතුරින් ලබා ගෙන ඇති ඉහළ ම සුදුසුකමට පමණක් ලකුණු හිමි වේ" | | මුළු ලකුණු 15 |
| III. | **අමතර සුදුසුකම්** | | |
| | 01. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සිදු කරන ලද විශේෂ ව්‍යාපෘති<br><br>(එක් ව්‍යාපෘතියකට ලකුණු 02 බැගින් ව්‍යාපෘති 05 ක් සඳහා උපරිම ලකුණු 10)<br><br>(අ) ව්‍යාපෘති ඇගයීමේදී ඇමුණුම 1 හි සඳහන් නිර්ණායක පදනම් කර ගනු ලැබේ.<br><br>(ආ) අයදුම්පත්‍රය සමඟ ව්‍යාපෘති ලැයිස්තුව ඉදිරිපත් කළ යුතු අතර එම ලැයිස්තුවේ ඇතුළත් ව්‍යාපෘති පමණක් සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලැබේ.<br><br>(ඇ) විශේෂ ව්‍යාපෘති සඳහා ලකුණු ලබා දීමේ දී ඇමුණුම 2 හි සඳහන් ලකුණු පරිපාටිය භාවිත කරනු ලැබේ.<br><br>"සැ.යු. - අයදුම්පත් භාර ගැනීමේ අවසන් දින හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති විය යුතුය" | ලකුණු 10 | මුළු ලකුණු 25 |
| | 02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය යටතේ පළ කරන ලද පර්යේෂණ/ ප්‍රකාශන<br><br>(එක් පර්යේෂණ/ප්‍රකාශනයකට ලකුණු 02 බැගින් පර්යේෂණ/ප්‍රකාශන 05 ක් සඳහා උපරිම ලකුණු 10) | ලකුණු 10 | |

| | | | |
|---|---|---|---|
| | (අ) පර්යේෂණ/ප්‍රකාශන ඇගයීමේදී ඇමුණුම **3** හි සඳහන් නිර්ණායක පදනම් කර ගනු ලැබේ.<br><br>(ආ) අයදුම්පත්‍රය සමඟ පර්යේෂණ/ප්‍රකාශන ලැයිස්තුව ඉදිරිපත් කළ යුතු අතර එම ලැයිස්තුවේ ඇතුළත් පර්යේෂණ/ප්‍රකාශන පමණක් සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලැබේ.<br><br>(ඇ) පර්යේෂණ/ප්‍රකාශන සඳහා ලකුණු ලබා දීමේ දී ඇමුණුම **4** හි සඳහන් ලකුණු පරිපාටිය භාවිත කරනු ලැබේ.<br><br>"සැ.යු. - ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට පත්වීම් ලද පසු සිදු කරනු ලැබූ පර්යේෂණ/ප්‍රකාශන විය යුතු අතර, අයදුම්පත් භාර ගැනීමේ අවසන් දින හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද පර්යේෂණ/ප්‍රකාශන විය යුතුය" | | |
| | **03. මණ්ඩල සහතිකය**<br>(වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය) | ලකුණු 05 | |
| IV. | **සම්මුඛ පරීක්ෂණය**<br>(කුසලතා, නායකත්වය, ආකල්ප, පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා සඳහා) | | **මුළු ලකුණු 10** |
| | **මුළු ලකුණු ප්‍රමාණය** | | **100** |

**10.** අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය හෝ ඊට ප්‍රථම ඒවා ආයතන ප්‍රධානීන් හෝ විමධ්‍යගත ඒකක / විශේෂිත ව්‍යාපාර ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

**11.** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.10.11 දිනැති අංක 1883/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි සහ එයට වරින් වර කරන ලද සංශෝධනයන්හි විධි විධාන, රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා පරිපාටික රීතීන්හි I වැනි කාණ්ඩයේ ඇතුළත් කොන්දේසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ඇතුළත් කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

**12.** මෙම නිවේදනයේ සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

**13.** මෙම තනතුරට පත් කිරීම සම්බන්ධයෙන් හෝ මෙම චක්‍රලේඛය මඟින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් හෝ යම් ගැටළුසහගත තත්ත්වයක් උදා වුවහොත්, ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ තීරණය අවසන් තීරණය වනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි,

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
කොළඹ 10.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ඇමුණුම 1

<u>විශේෂ ව්‍යාපෘති ඇගයීම සඳහා යොදා ගත යුතු නිර්ණායක</u>

I. ව්‍යාපෘතිය අයදුම්කරු විසින් අයදුම්කර ඇති තනතුරට අයත් රාජකාරි කටයුතු යටතට ගැනෙන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ව්‍යාපෘතියක් විය යුතුය.

II. ව්‍යාපෘති වාර්තාව මගින් ව්‍යාපෘතියේ අරමුණු, පූර්වාපේක්ෂිත ප්‍රතිඵල, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ස්ථානය, මූල්‍ය වටිනාකම, ව්‍යාපෘතියේ කාල රාමුව සහ මූල්‍ය ප්‍රභවය පැහැදිලිව ඉදිරිපත් කර තිබිය යුතුය.

III. ආයතනික හෝ ප්‍රජා සෞඛ්‍ය සම්බන්ධ ගැටළු/ ප්‍රශ්න සඳහා ව්‍යාපෘතිය මගින් නිර්මාණාත්මක සහ නවෝත්පාදක උපාය මාර්ග/ විසඳුම් හඳුන්වා දිය යුතු අතර ව්‍යාපෘතිය මගින් නිලධරයාගේ සාමාන්‍ය රාජකාරි කටයුතුවලින් ඔබ්බට ගිය මැදිහත්වීමක් සිදුවී තිබිය යුතුය.

IV. ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කර ගත් බවට අදාළ සුදුසු නිපුණතාවය සහිත ආයතනයකින් හෝ අධීක්ෂණ නිලධාරියකු විසින් සහතික කරන ලද බවට සාක්ෂි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

V. ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ව්‍යාපෘතියක් අයදුම්කරු විසින් භාරගෙන තවදුරටත් ඉටු කරගෙන යාමක් මේ යටතේ ලකුණු ලබා ගැනීම සඳහා සුදුසුකම් නොලබයි.

VI. නිලධරයාගේ රාජකාරී කටයුතුවල කොටසක් වශයෙන් නිලධරයා ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ/ ක්‍රියාත්මක බලධරයා/ සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරනු ලබන, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමක් ලෙස හෝ වැඩසටහන් සංවර්ධනය කිරීමක් වශයෙන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් ලකුණු ලබා දීම සඳහා සුදුසුකමක් නොවේ.

VII. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලැබූ පශ්චාත් උපාධි සුදුසුකමෙහි/ පශ්චාත් උපාධි පුහුණුවේ කොටසක් ලෙස ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

VIII. අයදුම්කරු විසින් අයදුම් පත්‍රය සමඟ තමන් <u>ලකුණු ලබා ගැනීමට අපේක්ෂා කරන ව්‍යාපෘති</u> පිළිබඳ ලැයිස්තුවක් (<u>උපරිම ව්‍යාපෘති 08 ක්</u>) අමුණා ඉදිරිපත් කළ යුතුය.

ඇමුණුම 2

<u>විශේෂ ව්‍යාපෘති සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය</u>

I. අයදුම්කරුවන් තමා විසින් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති අතුරින් තමා අයදුම්කරන තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට වඩාත් ගැලපෙන <u>**උපරිම ව්‍යාපෘති 08 ක්**</u> සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

II. ඇමුණුම 1 හි සඳහන් නිර්ණායකවලට අනුකූලව, එක් ව්‍යාපෘතියකට ලකුණු 02 බැගින් ව්‍යාපෘති 05 ක් සඳහා උපරිම ලකුණු 10 ක් (2*5 =10) ලබා දෙනු ලැබේ.

III. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති මඟින් අත්පත් කර ගන්නා ලද ප්‍රතිඵල පිළිබඳව ලකුණු ලබා දීමේ දී වඩාත් සැලකිලිමත් වනු ඇත. ———

ඇමුණුම 3

<u>පර්යේෂණ/ ප්‍රකාශන ඇගයීම සඳහා අදාළ කර ගත යුතු නිර්ණායක</u>

I. පර්යේෂණ/ප්‍රකාශන:

(අ) ජර්නල් පත්‍රිකා - සමාලෝචනයට ලක් කර අංකිත ප්‍රකාශන මාලාවක පළකරන ලද ශාස්ත්‍රීය වැදගත්කමක් සහිත සම්පූර්ණ පිටපතක් සහිත රචනයක් හෝ ලිපියක්

(ආ) සමුළු පත්‍රිකා/ උද්ධෘත/ අවසන් වශයෙන් පිටපත් කරන ලද රචනා

ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සම්මේලන, සභාවක්, සම්මන්ත්‍රණ, අධ්‍යන සම්මේලන, සංවාද මණ්ඩප, වැඩමුළු හෝ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා යොදා ගත් වාර්තා

**"සැ.යු. - ඉහත අවස්ථාවන් සඳහා එම පර්යේෂණ/ප්‍රකාශන ඉදිරිපත් කර ඇති බවට තහවුරු කිරීම අයදුම්කරුගේ වගකීම වේ."**

II. කර්තෘන් කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් පළකරන ලද පර්යේෂණ/ප්‍රකාශන සම්බන්ධයෙන් අයදුම්කරුගේ දායකත්ව ප්‍රමාණය පැහැදිලිව දක්වා තිබිය යුතු අතර, එම දායකත්ව ප්‍රමාණයට සමානුපාතිකව අයදුම්කරුට ලකුණු ලබා දෙනු ලැබේ.

III. එකම දත්ත/ පර්යේෂණ තොරතුරු මත පදනම්ව පළකරනු ලබන, බොහෝදුරට සමාන නිගමනයන්ට එළැඹී ඇති පර්යේෂණ/ප්‍රකාශන වෙන් වෙන් පර්යේෂණ/ප්‍රකාශන වශයෙන් සලකා බලනු නොලැබේ. එවැනි අවස්ථාවකදී ලකුණු ලබා දීම සඳහා එක් පර්යේෂණයක්/ප්‍රකාශනයක් පමණක් සලකා බලනු ලැබේ.

IV. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලැබූ පශ්චාත් උපාධි සුදුසුකමෙහි/ පශ්චාත් උපාධි පුහුණුවේ කොටසක් ලෙස පළකරන ලද පර්යේෂණ/ප්‍රකාශන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

ඇමුණුම 4

<u>පර්යේෂණ/ප්‍රකාශන සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය</u>

**01.** ලිපි සහ ජර්නල් පත්‍රිකා – ජාත්‍යන්තර/ජාතික මට්ටම/පිළිගත් උප ජාතික

1-3 – කතෘ ලැයිස්තුව – ලකුණු 02

>3 - ලකුණු 01

**02.** උද්ධෘත

1-3 – ලකුණු 01

>3 – ලකුණු 0.5

**03.** පෝස්ටර් ඉදිරිපත් කිරීම

1-3 – ලකුණු 01

>3 – ලකුණු 0.5

**04.** වාචික ඉදිරිපත් කිරීම - ලකුණු 0.5